ශීර්ෂය 266 - වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 266 - වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජූනි 05 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ආදායම් නොවන ලැබීම්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ වාහන විකිණීම්වලින් ලැබුණු අදායම රු.451,700 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්වීම වෙනුවට මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබීම, අනෙකුත් ඉන්වෙන්ට්‍රි අයිතම විකිණීමෙන් ලද රු.275,927 ක ආදායම ආයෝජන ක්‍රියාකාරකම් යටතේ රු.107,927 ක් ලෙස අඩුවෙන් දක්වා තිබීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.451,700 කින් වැඩියෙන්ද, ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ ජනිත වූ මුදල් ප්‍රවාහය රු.619,700 කින් අඩුවෙන්ද දක්වා තිබුණි.	මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදි, වැරදි දත්ත ඇතුලත් කිරීම හේතුවෙන් රු.168,000 ක ආදායම 2003-99-00 ආදායම් කේත යටතේ දැක්විමෙන් මූල්‍ය ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිතවූ වෙනත් අදායම් ශීර්ෂ වෙනුවෙන් රැස්කර මුදල් ප්‍රවාහයේ ආදායම් ලෙස දක්වා තිබුණි. ඉදිරියේදි මෙවැනි වැරදි සිදු නොවන ආකාරයෙන් දත්ත ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ.	වත්කම් විකිණීමෙන් ලද මුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයොජන ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතුය.

(ආ) ප්‍රාග්ධන වියදම්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ වවුනියාව දකුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.244,750 කට මිලදී ගත්, වායු සමීකරණ යන්ත්‍රයක් සහ පරිගණකයක් අදාල ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම වැය ශීර්ෂය 266-1-1-0-2103 වෙනුවට ප්‍රග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තු වියදම් 266-1-1-0-2002 වැය ශීර්ෂය යටතේ ගිණුම්ගත කර තිබුණු බව නිරීක්ෂණ විය.	ඉදිරියේදි මෙවැනි වැරදි සිදු නොවීමට අවශ්‍ය පාලන ක්‍රම අනුගමනය කරනු ලැබේ.	ස්ථාවර වත්කම් මිලදී ගැනීම් මූලධන වත්කම් අත්පත් කරගැනීම් වැය විෂය යටතේ ගිණුම්ගත කළ අතර අදාළ පරිදි මූල්‍ය ප්‍රකාශන ගැලපීම් කළ යුතුය.

(ඇ) දේපල, පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	සමාලෝචිත වර්ෂයේ භෞතික වත්කම් මිලදී ගැනීම් වටිනාකම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව රු.20,211,668 ක් ලෙසද, එය භාණ්ඩාගාර මුද්‍රිත සටහන (SA-82) අනුව රු.13,321,341 වූ බැවින්, රු.6,890,327 ක නොසැසඳීමක් නිරීක්ෂණ විය.	භාණ්ඩාගාරයේ CIGAS වැඩසටහනේ භෞතික වත්කම් ඇතුලත් කිරීමේ තාක්ෂණික දෝෂයක් බව හඳුනාගෙන ඇත.	විධිමත් පරිධි සැසඳීම් සිදු කර මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය සහ භාණ්ඩාගාර මුද්‍රිත අතරවූ වෙනස නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.
(ii)	වවුනියාව උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මූල්‍ය නොවන වත්කම් රු.12,600,000 ක වාහනවල වටිනාකම යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේ දැක්වීමෙන් වාහනවල වටිනාකම අදාල ප්‍රමාණයෙන් අඩුවෙන්ද, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණවල වටිනාකම එම ප්‍රමාණයන් වැඩියෙන්ද දක්වා තිබුණි. තවද 2022 වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉවත් කරන ලද වර්ග අඩි 2670 ක ගොඩනැගිල්ලේ වටිනාකම මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කර නොතිබුණි.	භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගෙන අදාල වත්කම් ක්ෂේත්‍ර යටතේ වෙන්කර දැක්වීමට කටයුතු කර ඇත.	වත්කම් අදාළ වත්කම් වර්ග යටතේ වර්ගීකරණය කළ යුතු අතර, මූල්‍ය ප්‍රකාශනවල අදාළ ගැලපීම් සිදු කළ යුතුය. එසේම ඉවත් කළ වත්කම් මූල්‍ය ප්‍රකාශනවල ගැලපිය යුතුය.

(ඇ) විගණන සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වාහන 25 ක වටිනාකම වන රු.45,919,724 ක් සනාථ කිරීමට අවශ්‍ය ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	වාහනවල වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කළ අතර, අදාල ලියවිලි ලේඛනාගාරයෙන් ලබා ගෙන කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.	වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කිරීමේදී වටිනාකම ලබා ගැනීමට පදනම් කරගත් ලිඛිත වාර්තා විගණනයට ඉදිරිපත් කළ යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු මෙම වාර්තාවේ 1.6.1 (ඇ) (ii) ඡේදයේ වත්කම් ඉවත් කිරීමට අදාළ නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 බැරකම් හා බැඳීම්වලට එළඹීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 16 වෙනි දිනැති අංක 06/2024 දරණ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම් පිළිබඳ මාර්ගෝපදේශයේ 3.3 ඡේදයට පටහැනිව 2024 දෙසැම්බර් 31 දිනට අනාවරණය නොකළ වගකීම් 05ක් සඳහා රු.376,282 ක් 2025 වර්ෂයේදී ගෙවීම් කර තිබුණි.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල දෙසැම්බර් මාසයේ විදුලි බිල සිගාස් වැඩසටහනේ ලැබීම් අතුලත් කිරීමේ අවසන් දිනයට පෙර නොලැබීම හේතුවෙන්ද, වෙනත් පුනරාවර්තන වැය විෂයන් 02 ක් සඳහා මුදල් ප්‍රතිපාදන නොතිබීමෙන් සිගාස් වැඩසටහන යටතේ වගකීමක් ලෙස ඇතුලත් කිරීමට කටයුතු නොකරන ලදී. ඉදිරියේදි, අදාල මාසයේ බිල්පත් ලබා ගෙන එම මාසයේම ගෙවීම් කිරීමට හෝ වගකීම් හා බැදීම් ලෙස දැක්වීමට කටයුතු කරනු ලැබේ.	ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැඳීම් ඇති කර නොගැනීමට කටයුතු කළ යුතුය.

3.2 වෙනත් අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුව විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශ 05 කින් සහ දෙපාර්තමේන්තුව 04 කින් පුණරාවර්තන වියදම් සඳහා ලබා දුන් ප්‍රතිපාදනයෙන් එකතුව රු. 29,343,395 ක් ඉතිරිවී තිබුණි. එය සියයට 20 සිට 41 දක්වා පරාසයක පැවතුණි.	2024.01.10 දිනැති 01/2024 අංක දරණ අයවැය චක්‍රලේඛය සහ ආණ්ඩු වෙනස් වීමෙන් පසු අනුමත කරන ලද ව්‍යපෘති ක්‍රියාත්මක නොකළ අතර මග නවතා තිබීම හේතුවෙන් මෙම මුදල ඉතිරි විය. මෙම මුදල අදාළ අමාත්‍යාංශවලින් නැවත ලබා ගැනීමට කටයුතු නොකිරීම නිසා මූල්‍ය ප්‍රකාශයේ දැක්වීමට කටයුතු කර තිබුණි.	ලබා දෙන ප්‍රතිපාදන ප්‍රදේශයේ සංවර්ධනය සඳහා අපේක්ෂිත අරමුණ ඉටුකර ගැනීමට සම්පූර්ණ ලෙස මුදලම වැය කිරීමට වැඩපිළිවෙලක් සකස් කල යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ අමත්‍යාංශ 04 කින් ප්‍රාග්ධන වැය සඳහා ලබා දුන් ප්‍රතිපාදන එකතුව රු.225,945,658 ක් වැය කර නොතිබුණි. එම ඉතිරිය සියයට 21 සිට සියයට 87 ක් දක්වා පරාසයක පැවතුණි.	2024.01.10 දිනැති 01/2024 අංක දරණ අයවැය චක්‍රලේඛය සහ ආණ්ඩු වෙනස් වීමෙන් පසු අනුමත කරන ලද ව්‍යපෘති ක්‍රියාත්මක නොකර අතර මග නවතා තිබීම හේතුවෙන් මෙම මුදල ඉතිරි විය. මෙම මුදල අදාල අමාත්‍යාංශවලින් නැවත ලබා ගැනීමට කටයුතු නොකිරීම නිසා	- එම -

මූල්‍ය ප්‍රකාශයේ දැක්වීමට කටයුතු කර තිබුණි.

3.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර, එම පද්ධතියේ සඵලදායී තත්ත්වය පිළිබඳ කලින් කල සමාලෝචන සිදු කර, ඒ අනුව අවශ්‍ය වෙනස්කම් සිදු කිරීමට අභ්‍යන්තර පාලන ක්‍රමයක් කඩිනමින් සකස් කර ක්‍රියාත්මක කිරීම කටයුතු කරන බව දැනුම් දෙමි.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතුය.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	නිරීක්ෂණය වටිනාකම රු.	අනුකූල නොවීම	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ				
	(i) XIX පරිච්ඡේදයේ 01 ඡේදය	-	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ තිබෙන රජයේ නිවාස 04ක් පදිංචිය සඳහා නිවාස ලබා ගැනීමට පොරොත්තු ලේඛනයේ නිලධාරීන් සිටියදීත් ඔවුන් වෙත ලබා නොදී,	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ තිබෙන රජයේ නිවාස සියල්ල පදිංචිය සඳහා සුදුසුය. නිලධාරීන් කිසිවෙකු පදිංචි වී නොමැති අවස්ථාවක රජයේ වියදම් අඩුකිරීමේ අදහසින් සහ අනෙකුත් රජයේ	ආයතන සංග්‍රහය අනුව රජයේ නිවාස උපයෝජන අරමුණ යටතේ වර්ගී කරන කළ යුතු අතර, අදාල අරමුණ සඳහා යොදවා ගැනීමට කටයුතු කළ යුතුය.

			රජයේ කාර්යාල අවශ්‍යතාවය සඳහා යොදවා ගෙන ඇති බව නිරීක්ෂණය විය.	දෙපාර්තමේන්තුවට අවශ්‍ය ගොඩනැගිලි පහසුකම් නොමැති අවස්ථාවල මහජන සේවය පුළුල් කිරීම සඳහා අදාල දෙපාර්තමේන්තුවේ ඉල්ලීම් අනුව, අමාත්‍යාංශයේ අනුමැතිය යටතේ රජයේ නිවාස ලබා දෙනු ඇත.	
(ii)	XIX පරිච්ඡේදයේ 6:1 ඡේදය	395,200	ත්‍රස්ත විමර්ශණ දෙපාර්තමේන්තුව වෙත 2011 මැයි 13 වෙනි දින ලබා දී තිබූ, වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත්, රජයේ නිවාසය බදු කාලය නිමවී තිබුණද, නිවස ආපසු ලබා ගැනීමටත්, හිඟ බදු කුලිය අයකර ගැනීමටත් වර්ෂ 10 කට වැඩි කාලයක සිට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.	නිවස ආපසු දෙන ලෙස ත්‍රස්ත විමර්ශණ දෙපාර්තමේන්තුවේ නිලධාරියාට එරෙහිව මහේස්ත්‍රාත් උසාවියේ නඩු පවරා තිබූ අතර, එම නඩු තීන්දුව අනුව හිඟ බදු කුලිය ගෙවා නිවස ආපසු බාරදීමට නියෝග නිකුත්කර තිබුණි.	නීතිමය විධිවිධාන අනුව කටයුතු කර නිවස ආපසු ලබා ගැනීමටත්, හිඟ කුලිය අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(iii)	XIX පරිච්ඡේදයේ 7:2 ඡේදය	386,606	වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු රජයේ නිවසක පදිංචිව සිට 2021 පෙබරවාරි 22 වෙනි දින විශ්‍රාම ලැබූ වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකුගෙන් කුලි සහ දඩ මුදල් අයකර ගැනීම සඳහා ඉකුත් වර්ෂ 04 කට වැඩි කාලයක සිට	බදු කාලය නිමවීමෙන් පසු රජයේ නිවසක පදිංචිව සිට කාල පරිච්ඡේදය සඳහා දඩ මුදල් ගණනය කර ඔහුගේ හිඟ ගෙවීම්වලින් අඩු කිරීමටත් ඉතිරි මුදල විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීමටත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත.	විශ්‍රාම වැටුප් ගෙවීමේ කටයුතු කඩිනම් කර හිඟ බදු සහ දඩ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුුතුය.

			අවශ්‍ය කටයුතු කර නොතිබුණි.		
(ආ)	2007 අප්‍රේල් 20 දිනැති අංක 22/2006 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	244,283	වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත්, රජයේ නිවසක් 2020 සැප්තැම්බර් 09 වෙනි දින හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වෙත ලබා දී තිබුණද, එම නිවසට අදාල හිඟ කුලිය ඉකුත් වර්ෂ 02 ක කාලයක සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	හිඟ බදු කුලිය සම්බන්ධයෙන් ලිපි යවා තිබුණද, හිඟ මුදල ගෙවීමට කටයුතු කර නොතිබුණු බැවින්, දැනට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාහට එරෙහිව නීතියානුකූලව කටයුතු කිරීම නියතව ඇත.	නීත්‍යානුකූල කටයුතු කඩිනමින් සිදු කර අදාළ හිඟ බදු කුලිය අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වවුනියාව දිස්ත්‍රික්කය තුළ පදිංචි සහ කෘෂිකර්ම කටයුතු වල යෙදී ඇති ඉඩම් නොමැති අය සඳහා ඉඩම් ලබා දීමට සහ දැනට ඉඩම් ලබා ගැනීමට සුදුසුකම් ලබා ඇති නීතියානුකූලව අයිතියක් නොමැති තැනැත්තන් සඳහා විධිමත් පරිදි බලපත්‍ර ලබා දීම සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2008 අගෝස්තු 20 දිනැති අංක 2008/04 දරණ ඉඩම් කළමනාකරණය විධිමත් කිරීම සඳහාවූ චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ඉඩම් කච්චේරි පවත්වා ඉඩම් සම්බන්ධ ආරවුල් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවූවත්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04 ක ග්‍රාම සේවා වසම් 100 ක ඉඩම් කච්චේරි සඳහා අයදුම්පත් 9,713 ක් ලැබී තිබුණද, වර්ෂ 01 සිට වර්ෂ 10 දක්වා ඉඩම් කච්චේරි පැවැත්වීමට කටයුතු කර නොතිබුණි.	කඩිනමින් ඉඩම් කච්චේරි පවත්වා ඉඩම් මහජනයාට ලබා දීමට කටයුතු කරන බව දන්වා සිටිමි.	පවතින නීති රාමුව තුළ විධිමත් පරිදි ඉඩම් කච්චේරි පවත්වා මහජනයාගේ ඉඩම් සම්බන්ධ ගැටළු නිරාකරණය කිරීමට කටයුතු කළ යුතුය.

(ආ)	1982 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ සකස්කර අත්සන්කර තිබූ එහෙත් මහජනයා වෙත ලබා දිය යුතු ඉඩම් බලපත්‍ර 1,985 ක් සහ දීමනාපත්‍ර 1,524 ක් අදාළ අය වෙත ලබා දීමට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 04 හි ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් කටයුතු කර නොතිබුණි.	බලපත්‍ර 07 ක් දැනට ලබා දී ඇත. අතැති බලපත්‍ර හා දීමනාපත්‍ර අදාළ අය වෙත ලබා දීමට කටයුතු කරන අතර, අයිතිකරුවන් හඳුනා ගැනීමට නොහැකි බලපත්‍ර අවලංගු කිරීමට කටයුතු කරනු ලැබේ.	නිසි අයිතිකරුවන් වෙත බලපත්‍ර හා දීමනාපත්‍ර ලබා දීමටත්, අයිතිකරුවන් හඳුනා ගැනීමට නොහැකි බලපත්‍ර විධිමත් පරීක්ෂාවකින් පසුව අවලංගු කිරීමටත් කටයුතු කළ යුතුය.

4.2 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දැනට වෙළඳ වානිජ ආහාර සුරක්ෂතතා සහ සමූපකාර සංවර්ධන යටතේ ඇති එවකට ග්‍රාමීය අර්ථික කටයුතු අමාත්‍යාංශ විසින් රු. මිලියන 291.6 ක් වියදම් දරා ඉදිකර තිබූ වවුනියාව ආර්ථික මධ්‍යස්ථාන ගොඩනැගිල්ල 2018 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු නිමකර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට භාරදී තිබුණද, 2024 දෙසැම්බර් 31 දින දක්වා ඉදිකරන ලද අරමුණ සඳහා යොදවා නොතිබුණු අතර, 2018 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා ආරක්ෂක සේවය සහ පවිත්‍රතා වියදම් සහ ජල බිල්පත් ගාස්තුව ලෙස රු. මිලියන 14.3 ක් වැය කර තිබුණු බව නිරීක්ෂණය විය.	ආර්ථික මධ්‍යස්ථානය විවෘත කිරීම සඳහා අවශ්‍ය කටයුතු අමාත්‍යාංශයේ දැනුවත් කිරීම මත අප විසින් ගනු ලැබුවද, ඒ සඳහා අවශ්‍ය අනුමැතිය මෙතෙක් ලැබී නොතිබුණි. ආර්ථික මධ්‍යස්ථානය නඩත්තු කිරීම සඳහා ආරක්ෂක සේවා වියදම්, පවිත්‍රකිරීම් සේවා වියදම් සහ විදුලි ගාස්තු වියදම් දරනු ලැබේ	විධිමත් පරීක්ෂණයක් පවත්වා අරමුණුගත කාර්ය සඳහා ව්‍යාපෘතිය යෙදවීමට කටයුතු නොකළ නිලධාරීන්ට පියවර ගැනීමටත්, ව්‍යාපෘතියේ ප්‍රතිලාභ මහජනයාට ලැබෙන පරිදි ආර්ථික මධ්‍යස්ථානය කඩිනමින් විවෘත කිරීමට කටයුතු කළ යුතුය.

4.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වවුනියාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් පරන්නට්ටගල් පෙර පාසල් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2019 දෙසැම්බර් 06 වෙනි දින නිමකළ යුතු විය. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් රු.1,551,712 ක් වැය කර තිබුණද, 2025 මැයි 28 දක්වා නිම කර නොතිබීමෙන් දරා ඇති වියදම නිෂ්ඵල වියදමක් බව නිරීක්ෂණය විය.	අදාළ කාල පරිච්ඡේදයට අයත් අග්‍රිම මුදල් වර්ෂයතුලම නොලැබීමෙන්, මෙම ව්‍යාපෘතිය ගිවිසුම්ගත දිනට නිම කිරීමට නොහැකිවූ බව දන්වා සිටිමි.	විධිමත් අධීක්ෂණයක් හා පසු විපරමක් සිදු නොකර ව්‍යාපෘතිය අතහැර දමා ඇති නිලධාරීන්ට පියවර ගැනීමටත්, ගොඩනැගිල්ලේ ඉදිරි කටයුතු නිමකර අදාළ අරමුණ සඳහා යොදවා ගැනීමටත් කඩිනමින් කටයුතු කළ යුතුය.

4.4 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	නැවත පදිංචි කිරීම්, නිවාස පහසුකම් සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන වලින් වවුනියාව උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2023 සහ 2024 වර්ෂවලදී ක්‍රියාත්මක කර තිබූ රු. මිලියන 1 සහ රු. මිලියන 0.6 නිවාස යෝජනා ක්‍රමවල පිළිවෙලින් ප්‍රතිලාභීන් 06 දෙනෙකු සහ 03 දෙනෙකු වෙත නිවාස පූර්ණ ලෙස ඉදිකර නොතිබියදී මුළු මුදලම ඔවුන්ගේ බැංකු ගිණුම්වල තැන්පත් කර නැවත ලබා ගත නොහැකි පරිදි රු. 1,396,000 ක් රඳවා තිබුණු බව නිරීක්ෂණ විය.	නිවාස ව්‍යාපෘතියට අදාළ මුදල් සහ විවිධ හේතූන් මත ප්‍රමාද වී තිබුණු අතර, අදාල කාලයතුල සම්පූර්ණ කර නොතිබුණි. දැනට එම වැඩ කොටස් කර ගෙන යන බැවින් 2025.06.30 දිනට පෙර සියළු වැඩ නිමකර මුදල් නිදහස් කරනු ලැබේ.	සම්පූර්ණයෙන් ඉදිකර නොතිබූ නිවාස සඳහා මුදල් නිදහස් කිරීමට කටයුතු කළ නිලධාරීන්ට එරෙහිව කටයුතු කිරීමත්, අමාත්‍යාංශයේ මාර්ගෝපදේශ අනුව ඉදිකිරීම් ප්‍රගතිය අනුව ප්‍රතිලාභීන්ට මුදල් නිදහස් කිරීමටත්, නිවාස ව්‍යාපෘතිය කඩිනමින් සම්පූර්ණ කිරීමටත් පියවර ගත යුතුය.

4.5 දේශීය අරමුදල් වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ වවුනියාව ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිල්ලේ අළුත්වැඩියා කටයුතු දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් කොන්ත්‍රාත් ගිවිසුම් 06 ක් යටතේ රු.23,075,278 ක් වියදමින් 2023 නොවැම්බර් 14 සිට 2024 ඔක්තෝබර් 06 වන දින දක්වා කාලය තුළ සිදුකර තිබුණි. මෙම වැඩ කොටස් සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණ විය.		
(i)	එක කොන්ත්‍රාත්තුවකට අදාළ වැඩ කොටස් 2024 අගෝස්තු 07 දින සම්පූර්ණ කළ බවට වැරදි ලෙස නිර්දේශය ලබා දී රු.300,000 ක් ගෙවීම් කර තිබුණද, 2025 ජනවාරි 07 දින දක්වා වැඩ නිමකර නොතිබුණි.	දැනට මෙම අඩුපාඩු සම්පූර්ණ කර ඇති අතර, මෙම කාර්යාලය කඩිනමින් විවෘත කළ යුතු බැවින්, කලින් පිහිටා තිබූ කාර්යාලයේ භාණ්ඩ ගලවා නව කාර්යාලයේ සවිකරන යුතු බැවින්, පසුපස වැට සහ කාර්යාලයේ පිටත වැසිකිළියේ ඉදිකිරීම් කටයුතු ඉදිරි වර්ෂයේ ප්‍රතිපාදනයෙන් ගෙවීමට	වැරදි ලෙස නිර්දේශ ලබා දී ගෙවම් සිදු කළ නිලධාරීන්ට විරුද්ධව කටයුතු කිරීමටත් ප්‍රමාණ පත්‍ර බිල්වල (BOQ) සඳහන් කර ඇති පිරිවිතර අනුව වැඩ නිමකිරීමෙන් පසු පමණක් ගෙවීම් කිරීමටත් පියවර ගත යුතුය.

		කොන්ත්‍රාත්කරු සමග පොරොන්දුවී මැද කොටස් නිමකර ඇත. එහෙයින් මෙම වැඩ සඳහා වැඩි අවදායක් යොමු නොකර, ගෙවීම් කරනු ලදී. කෙසේවූවද, ඉතිරි වැඩ කොටස් සඳහා මෙතෙක් ගෙවීම් සිදු කර නොතිබුණි.	
(ii)	එක් කොන්ත්‍රාත්තුවක වැඩ විෂයන් සඳහා ගෙවීම් කිරීමේදී මිල උපලේඛන (Schedule of rate) පොතෙහි සඳහන් රේට්වලට අනුකූල නොවී ගෙවීම් සිදු කිරීම නිසා රු. 91,612 ක් වැඩිපුර ගෙවීමක් සිදු කර තිබුණි.	ඉහත ඔබගේ ගණනය කිරීමේදි අඩුපාඩු තිබෙන බව දැනුම් දෙන අතර එය නිවැරදිව ගණනය කිරීම සඳහා VAT බදු ද ඇතුළත් විය යුතුය. එසේම, දෙපාර්තමේන්තුව Supervision සහ Bill preparation කිරීමේදි පමණක් ප්‍රජා සමිතිවලට Over head අඩුකල හැකිබව දැනුම් දීමට කැමැත්තෙමි.	විධිමත් පරීක්ෂාවක් සිදු කර වැඩිපුර ගෙවන ලද මුදල අයකර ගත යුතු අතර, වැරදි ලෙස නිර්දේශ ලබා දුන් අයට එරෙහිව කටයුතු කළ යුතුය.
(iii)	කොන්ත්‍රාත්තුවේ වැඩ විෂයය අනුව 600mm*600mm size ceramic tiles අල්ලා ඇති අතර, ගෙවීම් කිරීමේදී 600mm*600mm homogenous tiles හි වටිනාකම යොදාගෙන ඇති බැවින් රු. 32,207 ක වැඩිපුර ගෙවීමක් සිදුවී ඇති බව නිරීක්ෂණ විය.	අප විසින් ඉල්ලුම් කළ පරිදි Tiles වලට Schedule Rate නොමැති බැවින් Rate analysis කර Rate සඳහන් කරන ලදි. තවද, Homogenous Corclain polished floor tiles යොදන ලෙස ඉල්ලීම් නොකළ බව කරුණාවෙන් දන්වා සිටිමි.	- එම -
(iv)	එක් කොන්ත්‍රාත්තුවක විෂයය අංක 16 අනුව, supper flex suspended ceiling වෙනුවනේ gypsum ceiling sheet යොදා තිබූ බව නිරීක්ෂණය විය.	Supper Flex suspended ceiling වඩා Gypsum ceiling වටිනා කම වැඩිය. මේ හේතුවෙන් ඉහත ගෙවීම් මගින් මූල්‍ය පාඩුවක් සිදුවී නොමැති බව කාරුණිකව දන්වා සිටිමි.	ඉන්ජිනේරු ඇස්තමේන්තු අනුව ඉදිකිරීම් සිදු කළ යුතුය.

4.6 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 02 ක් සතු වාහන 05 ක් ප්‍රයෝජනයට ගැනීමට ඉකුත් වර්ෂ 02 සිට වර්ෂ 12 කට වඩා වැඩි කාලයක් කටයුතු කර නොතිබුණි.	වාහන 05 ක් ප්‍රයෝජනයට ගත නොහැකි තත්වයක තිබෙන බැවින්, ඒවා අපහරණය කිරීමට කටයුතු කරනු ලැබේ.	විධිමත් පරීක්ෂාවක් සිදු කර භාවිතයට ගත නොහැකි වත්කම් අපහරණය කිරීමට කටයුතු කළ යුතුය.

(ආ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතුව නිලධාරීන්ගේ පදිංචිය සඳහා වෙන්කර දී නොමැති ප්‍රයෝජනයට ගත හැකි තත්වයේ රජයේ නිවාස 03 ක් තිබෙන අතර, තවත් රජයේ නිවාස 02 ක් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගත හැකි තත්වයේ පවතින බැවින්, එම නිවාස වර්ෂ 04 සිට වර්ෂ 06 කට වඩා වැඩි කාලයක් ප්‍රයෝජනයට ගැනීමටත් කටයුතු කර නොතිබුණි. පොරොත්තු ලේඛනයේ නිවාස ලබා ගැනීමට බලා සිටින අයදුම්කරුවන් 90 ක් සිටින බව ද නිරීක්ෂණය විය.	නිවාස 03 ක් ලැයිස්තු ගත නිවාස ලෙසත්, නිවාස 02 ක් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කරනු ලැබේ.	රජයේ නිවාස අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමටත් දැනට ප්‍රයෝජනයට ගත හැකිව තිබෙන නිවාස පොරත්තු ලේඛනයේ සුදුසුකම් සපුරා ඇති අයට ලබා දීමටත් කටයුතු කළ යුතුය.

4.7 රජයේ නිලධාරින්ගේ ඇප තැබීම

	විගණන නිරික්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 2022 මාර්තු 16 වෙනි දිනැති අංක 04/2022 දරණ චක්‍රලේඛය අනුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඇප තැබියයුතු නිලධාරීන් 10 දෙනෙක් ඇප තැබීමට කටයුතු කර නොතිබුණි.	වවුනියාව උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් 04 දෙනෙකු ඇප මුදල් තැන්පත් කර ඇති අතර, අනිකුත් නිලධාරීන්ගෙන් ඇප ලබා ගැනීමට කටයුතු කරමින් ඇත.	චක්‍රලේඛ අනුව ඇප මුදල් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

4.8 කළමනාකරණ දුර්වලතා

	විගණන නිරික්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවාසවල පදිංචිකරුවන්ගෙන් රු.309,068 ක හිඟ කුලි අයකර ගැනීමට වර්ෂ 02 සිට 05 කට වැඩි කාලයක සිට කටයුතු කර නොතිබුණි.	හිඟ කුලි ගෙවන බව අදාල දෙපාර්තමේන්තුවෙන් දන්වා ඇත. 08 New In ලේඛකාධිකාරී විසින් අදාල හිඟ කුලිය නිවැරදි කිරීමට කටයුතු කර අදාල පිටපතක් අප වෙත එවා තිබුණි. පාර්ලිමේන්තු මන්ත්‍රිවරයාට එරෙහිව නීතියානුකූලව කටයුතු කිරීම් ආරම්භ කර ඇත.	හිඟ මුදල් අයකිරීමට කාලීනව කටයුතු නොකළ පාර්ශවයන්ට පියවර ගැනීමටත්, හිඟ මුදල් කඩිනමින් අයකිරීමට කටයුතු කිරීමත් කළ යුතුය.
(ඇ)	වවුනියාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රජයේ ඉඩම් දීර්ඝ කාලීනව බදු දීම සම්බන්ධයෙන් අයවිය යුතු බදු මුදල්	හිඟ බදු කුලි සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස්තුමාගේ උපදෙස් අනුව නීතියානුකූලව	හිඟ බදු හා දඩ මුදල් අය කිරීමට කටයුතු නොකළ නිලධාරීන්ට පියවර

	වාරිකය සහ දඩ මුදල් වල එකතුව රු.33,494,996 ක් අයකර ගැනීමට වර්ෂ 01 සිට වර්ෂ 47 කට වැඩි කාලයක් කටයුතු කර නොතිබුණි.	කටයුතු කිරීමට නියමිතයි.	ගැනීමටත්, බදු කුලිය සහ දඩ මුදල කඩිනමින් අයකර ගැනීමට කටයුතු කිරීමත් කළ යුතුය.
(ඈ)	වවුනියාව උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ වවුනියාව දකුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් විශ්‍රාමිකයන් 02 දෙනෙකුට වැඩිපුර ගෙවා තිබූ රු.201,440 ක විශ්‍රාම වැටුප් ඉකුත් මාස 11 සිට මාස 23 කට වඩා වැඩි කාලයක් අයකිරීමට කටයුතු කර නොතිබුණි.	ඒ.ඒ.මයිල්වාහනම් මහතාට වැඩිපුර ගෙවූ මුදලින් රු.15,000 ක් ඔහුගේ දුවගෙන් අයකරගත් අතර, ඉතිරි මුදල ඇයගේ මාසික වැටුපෙන් අයකර ගැනීමට කටයුතු කර අතර, වැඩිපුර ගෙවා ආපසු අයකරගත් මුදල විශ්‍රාම වැටුප් දෙපාර්තමෙන්තුවට ප්‍රේෂණය කර ඇත. අනෙක් විශ්‍රාමිකයට වැඩිපුර ගෙවූ මුදල කොටස් වශයෙන් ආපසු ගෙවීමට බව ඥාතින් විසින් බාර ගෙන රු.5,000 ක් ගෙවා ඇත. මුළු මුදලම අයවීමෙන් පසු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කරනු ලැබේ.	විධිමත් පරීක්ෂණයක් පවත්වා වැඩිපුර ගෙවීම් සඳහා නිලධාරීන් වගකිව යුතුනම් ඊට අදාළ පියවර ගැනීමටත්, විශ්‍රාම වැටුප් චක්‍රලේඛ ප්‍රකාරව වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට කඩිනම් පියවර ගැනීමත් කළ යුතුය.

5. මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය අවසානය දක්වා දිස්ත්‍රික් ලේකම් කාර්යලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවක පුරප්පාඩු 57 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.	රාජ්‍ය පරිපාලන,පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යංශය විසින් පුරප්පාඩු පිරවීමේ කටයුතු කරනු ලැබේ. කෙසේ වුවද, මෙතෙක් පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි.	කාර්ය මණ්ඩල සමාලෝචනයක් සිදු කර අත්‍යාවශ්‍යම කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කළ යුතුය.